**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය**
**පාසල් මට්ටම**

**9 ශ්‍රේණිය** | **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන**
**කාලය පැය 01.30 යි.**

1 කොටසින් එක් ප්‍රශ්නයක් ද 11 කොටසේ 'අ' යටතේ ඇති ප්‍රශ්නවලින් එකක් ද 'ආ' යටතේ ඇති ප්‍රශ්නවලින් එකක් ද 'ඉ' යටතේ ඇති ප්‍රශ්නවලින් එකක් ද වශයෙන් ගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

**1 කොටස**

පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 250ට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

(අ) වත්මන් සමාජය විද්‍යාවෙන් හා තාක්ෂණයෙන් විශාල දියුණුවක් අත්පත් කර ගත්ත ද එහි අනිසි විපාකවලට ද ගොදුරු වී ඇත . එම නිසා සමස්ත සමාජය ම විද්‍යාවේ හා තාක්ෂණයේ පිහිට ලැබිය යුත්තේ ඉතා ප්‍රවේසමෙනි. මෙම කරුණු සැලකිල්ලට ගෙන 'විද්‍යාව හා තාක්ෂණය මානව යහපතට යොදවමු' මැයෙන් රචනයක් ලියන්න.

(ආ) අතීතයේ මෙන් නොව වත්මන් සමාජය සාහිත්‍ය රස වින්දනයෙහිලා තරමක් ඈත් වෙමින් සිටියි. සංකීර්ණ සමාජ පසුබිම තුළ යාන්ත්‍රික මිනිසුන් සුලබ ය. එනිසා සාහිත්‍ය රසකාමී පරපුර සාහිත්‍ය නමැති ගෘහයෙහි පැල දොරින් පලා ගොස් ඇත සංවර්ධිත සමාජයක මානව පරපුර ගසට පොත්ත මෙන් සම්බන්ධ විය යුතු ය මෙම කරුණු සැලකිල්ලට ගෙන 'සාහිත්‍ය රසකාමී පරපුරකින් සමාජ සංවර්ධනය' මැයෙන් රචනයක් ලියන්න

(ඉ) සාපරාධී පුද්ගලයින් නිසා හිංසනයට පත් වන දරුවන් සම්බන්ධ ඛේදනීය පුවත් නිතර අසන්නට ලැබේ. දෙමාපියන්ගේ සහ සමාජයේ අවධානය දරුවන් කෙරෙන් ගිලිහී යාමත් දරුවන්ට නිසි තැන නොලැබී යාම ආදිය ද මේ සඳහා බලපා ඇත . මෙම කරුණු සැලකිල්ලට ගෙන 'දරුවන්ට සුරක්ෂිත සමාජයක් ගොඩනගමු' මැයෙන් රචනයක් ලියන්න.
(ලකුණු 25)

**11 කොටස**

**අ කොටස**

(1) පසුගිය දා ඔබ විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සිදු විය. එහි දී ත්‍යාග රාශියක් ලද ඔබේ සිතැඟි විදෙස් රටක සිටින පියාට දන්වා ලිපියක් ලියන්න.

(11) ඔබ පාසලේ පුස්තකාලය අසල අවධානම් සහගත කොස් ගසක් ඇත . එය හැකි ඉක්මනින් ඉවත් කර ගත යුතු නිසා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා පාසල් සංවර්ධන සමිතියේ සමන් සමරරත්න මහතා විසින් ප්‍රාදේශීය ලේකම්තුමාට යවන ලිපිය ලියන්න.
(ලකුණු 25)

**ආ කොටස**

(1) ඔබ විදුහලේ හදිසි ආපදාවන්ට ලක් වූවන් සඳහා ප්‍රථමාධාර ඒකකයක් ආරම්භ කර ඇත . ප්‍රථමාධාර

ලබා දීම පිළිබඳ නිසි පුහුණුවක් නොමැතිකම ගැටලුවකි. පාසල් ප්‍රථමාධාර කණ්ඩායමට අවශ්‍ය පුහුණුව ලබා

දෙන ලෙස ඉල්ලා රතු කුරුස සංගමයේ ප්‍රාදේශීය කලමනාකාරතුමාට යවන ලිපිය සකසන්න. පාසල් ප්‍රථමාධාර

සංගමයේ කේ. කේ. පියල් ඔබ යයි සිතන්න.

(11) මෙම දිනවල ඔබ ප්‍රදේශයේ බහුල ව පැතිර යන ඩෙංගු උවදුර මැඩ පැවැත්වීමට අවශ්‍ය දැනුවත් කිරීම්

ඇතුළත් අත් පත්‍රිකාවක් පිළියෙල කරන්න. (ලකුණු 25)

ඉ කොටස

(1) වැඩිහිටියන්ට සැළකීම අද සමාජයෙන් සැළකිය යුතු මට්ටමට පහළ වැටී ඇත . වැඩිහිටියන්ට සැළකීමෙහි

ආදීනව පෙන්වා පාසල් භූමියේ ප්‍රදර්ශනය කිරීමට සුදුසු පෝස්ටරයක් සකසන්න. (ලකුණු 25)

(11) ඔබ පාසලේ මාධ්‍ය ඒකකයට ඇතුළත් වීම සඳහා ඔබේ තොරතුරු ඇතුළත් කර අයදුම්පතක් සකසන්න.